PR/2019/4/S

ජපන් ජනතාවගෙනි
ஜப்பானிய மக்களிடமிருந்து
From the People of Japan


**ජපාන තානාපති කාර්යාලය**

නො. 20, ශ්‍රීමත් ආර්. ජී. සේනානායක මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව

දුරකථනය (+94-11-2693831~3, ෆැක්ස් (+94-11-2698629)

ඊමේල්: cultujpn@co.mofa.go.jp


**පුවත්පත් නිවේදනය**

2019 ජනවාරි මස 25 වන දින

## ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ බිම්බෝම්බ ඉවත් කිරීමේ මානුෂීය මෙහෙයුමට ජපානයෙන් ආධාර

ජපාන රජය, එහි බිම් මට්ටමේ මානව ආරක්ෂණය සඳහා වන ආධාර ව්‍යාපෘතිය (GGP) යටතේ, ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ ක්‍රියාත්මක වන බිම්බෝම්බ ඉවත් කිරීමේ මානුෂීය මෙහෙයුම සඳහා, ඇමෙරිකානු ඩොලර් 624,382 ක (දළ වශයෙන් රුපියල් මිලියන 100 ක) ආධාර මුදලක් ලබා දීමට තීරණය කර ඇත. මේ සඳහා වන ගිවිසුමට කොළඹ පිහිටි ජපන් තානාපති නිළ නිවසේදී 2019 ජනවාරි මස 24 වන දින ජපන් තානාපති ගරු අකිරා සුගියාමා මැතිතුමා සහ Delvon Assistance for Social Harmony (DASH) සංවිධානයේ වැඩසටහන් කළමණාකාර ආනන්ද චන්ද්‍රසිරි මහතා ද අත්සන් තැබීය.

වර්ෂ 2003 සිට මේ දක්වා උතුරු නැගෙනහිර ප්‍රදේශයන්හි බිම්බෝම්බ ඉවත් කිරීමේ කාර්යයන් සඳහා බිම් මට්ටමේ මානව ආරක්ෂණය සඳහා වන ආධාර ව්‍යාපෘතිය (GGP)යටතේ ආසන්න වශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 34.5 ක් ලබා දී ඇත. ශ්‍රී ලංකාවේ අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීමටත්, ඔවුන්ගේ කෘෂිකාර්මික කටයුතු නැවත ආරම්භ කිරීමටත්, එමෙන්ම වෙනත් ජීවනෝපායන් ආරම්භ කිරීම සඳහාත් වර්ෂ 2020 වන විට ශ්‍රී ලංකාව බිම්බෝම්බ බලපෑම් වලින් නිදහස් වීමේ ඉලක්කයට ලඟා වීමටත් ජපාන රජය ඉමහත් දායකත්වයක් ලබා දී තිබේ.

2010 සිට ඩෑෂ් (DASH) සංවිධානය බිම්බෝම්බ ඉවත් කිරීමේ කටයුතුවල නිරත වී සිටි. එමෙන්ම තවදුරටත් බිම්බොම්බ ඉවත් කිරිමෙ කටයුතු, යාපනය, කිලිනොච්චි සහ මුලතිවු යන දිස්ත්‍රික්ක වල ක්‍රියාත්මක කිරිමට ඔවුන් බලපොරත්තු වේ. මෙම මූල්‍යාධාරය පිළිබඳව අදහස් දක්වමින් ඩෑෂ් (DASH) සංවිධානයේ වැඩසටහන් කළමණාකාර ආනන්ද චන්ද්‍රසිරි මහතා ප්‍රකාශ කලේ "ශ්‍රී ලංකාවේ බිම්බෝම්බ ඉවත් කිරීමේ වැඩසටහන සඳහා ජපානය නොනවත්වා ආධාර ලබා දෙන අතර, ඩෑෂ් සංවිධානය සඳහා ද, 2010 සිට නොනවත්වා ආධාර ලබා දුන් බවයි. රටේ දශක තුනකට වැඩියෙන් පැවතුනු අභ්‍යන්තර අර්බුදය හෙතුවෙන් බිම්බොම්බ හා පුපුරන ද්‍රව්‍ය කැබලි ඉතිරි වී ඇති ප්‍රදේශ තවමත් ඇත.

ශ්‍රී ලංකාව තුල සාමය ගොඩනැගීම සඳහා වූ ක්‍රියාවලියේ සාර්ථකත්වයට දායක වන ප්‍රධානතම සාධකය වන්නේ මෑතදී රටේ පැවති අභ්‍යන්තර අරගලයෙන් සාජුව හෝ වක්‍රව බලපෑමට ලක්වූ තරුණ තරුණියන් සඳහා රැකියා අවස්ථා සලසා දීමය. ඒ අනුව, එය ඔවුනට ජීවනෝපාය මාර්ගයක් සලසා දීම පමණක් නොව, ඔවුන් විසින් අපේක්ෂිත සමාජ පිළිගැනීමට ඔවුන් ඔසවා තැබෙන සාධකයක් ද වනු ඇති බව ඩෑෂ් (DASH) සංවිධානය විශ්වාස කරනවා. ඩෑෂ් (DASH) සංවිධානයට ආධාර සපයන මාහැඟි ප්‍රදායකයින්ගේ මූල්‍යාධාර හරහා උතුරෙහි අසරණභාවයට පත්ව ඇති තරුණ තරුණියන් විශාල සංඛ්‍යාවකට රැකියා අවස්ථා ලබාදීමෙන්, ශ්‍රී ලංකා රජයෙන් ක්‍රියාත්මක සාමය සහ සංහිඳියාව සඳහා වන ප්‍රයත්නයට හැකි පමණින් හෝ ශක්තියක් වීමට ඩෑෂ් (DASH) සංවිධානයට හැකිවී තිබේ.ජපානයේ සහ ජපන් ජනතාවගේ සමීප මිත්‍රත්වය හා පරිත්‍යාගීලිත්වය සෑම ශ්‍රී ලංකිකයෙකු විසින්ම ඉමහත් ලෙස අගයනු ලබනවා".

වැඩි විස්තර සඳහා කරුණාකර අමතන්න
ජපාන තානාපති කාර්යාලයේ සංවර්ධන සහයෝගිතා අංශය
දුරකථන අංක 011-2693831 දිගුව 225
ඊමේල් : cultujpn@co.mofa.go.jp